ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක : HRC/P/i/S/13/06/23

# මාධ්‍ය නිවේදනය

2022 වසරේ මැයි මස 09 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ දේශපාලඥයින් සම්බන්ධ පුද්ගලයින් කණ්ඩායමකගේ පුද්ගලික දේපල සහ පොදු දේපල රැසකට හානි කිරීම් සිදුවිය. මෙම හානි කිරීම් සම්බන්ධයෙන් නීතිය නිතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්වයං මැදිහත්වීමෙන් පරීක්ෂණයක් ආරම්භ කරන ලදී. මෙම හානි කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි 70 කට අධික ප්‍රමාණයක් ද ලැබී ඇත.

අද දින එනම් 2023 ජූනි මස 13 වන දින මෙම පැමිණිලි අතර, අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා විසින් ගොනු කරන ලද පැමිණිල්ලකට අදාළව ප්‍රකාශයන් සටහන්කර ගැනීමක් සිදුකරන ලදී. තවද මෙම හානි කිරීම් වලට අදාළව පොලිස්පතිවරයා විසින් පත්කරන ලද විශේෂ විමර්ශන කමිටුවේ සාමාජිකයෙකු වන එවකට පොලිස් අපරාධ හා රථවාහන දිසාව භාරව කටයුතු කළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා වෙතින් පැමිණිල්ලි සම්බන්ධයෙන් සිදුකරන ලද පොලිස් විමර්ශනයන්ට අදාළව ප්‍රකාශයක් සටහන් කර ගන්නා ලදී. තවද පරීක්ෂණයේදී හෙළිවූ සැකකරුවෙකු සම්බන්ධයෙන් විමර්ශන වාර්ථාවක් 2023 ජූනි මස 15 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබාදෙන ලෙස දැනුම්දීමක් සිදුකරන ලදී. එම තොරතුරු ද පදනම් කරගෙන ඉදිරි පරීක්ෂණ කටයුතු කඩිනම්ව සිදුකරනු ලැබේ.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.06.13